**ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 වන දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 09 ක සිට පැවත එන මියගියනිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 164,953 ක ණය ශේෂය,අයකර ගැනීම සම්බන්ධයෙන්දෙපාර්තමේන්තුව මෙතෙක් ප්‍රමාණවත් ඉදිරි පියවර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනිම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතුය. | ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ කටයුතු කරමින් පවතී. |
| (ii) | වසර 05 ක සිට පැවත එන සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු. 132,846 ක ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන්ද දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ඉදිරි පියවර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනිම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතුය. | ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් උසාවියේ නඩු පවරා ඇත. |

**(ආ) වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ /ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | **විවිධ අත්තිකාරම් ගිණුම (25003)**<br>------------------------------------<br>2018 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 173,004,106 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.173,599,852 ක් වූ මෙම ශේෂයෙන් වර්ෂය තුළදී රු.595,747 ක් හා 2019 මාර්තු වනවිට රු.15,275,000ක් හේතුවෙන් එය 2017 වර්ෂය අවසාන ශේෂයෙන් සියයට 9 ක් පමණක් විය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතුය. | අදාල ආයතන සමඟ සෘජුව කටයුතු කරමින් නිරන්තරයෙන් පසු විපරම් කටයුතු කොට හිඟ මුදල් අයකර ගැනීමට අදාල ආයතනවලට උපදෙස් හා සහාය ලබාදෙනු ලබයි. |
| (ii) | ලිපිගොනු අනුව, 2017 වර්ෂය තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් යනාදිය | හිඟ ණය ශේෂ අය කර ගැනිම සඳහා | උප අත්තිකාරම් ලබාදුන් ආයතන එකවර සම්බන්ධ කර ගැනීමට පැවති |

| | | | |
|---|---|---|---|
| | පවත්වමින් හිඟ ශේෂ අයකර ගැනීම සඳහා උත්සාහ දරා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව එසේ පසුවිපරම් කටයුතු සිදු කළ බව විගණනයේදී නිරීක්ෂණය නොවුනු අතර රු.14,959,629 ක මුදලක් කපා හැරීමට අවශ්‍ය පියවර පමණක් ගෙන තිබුණි. | ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතුය. | බාධාවන් හේතුවෙන් පෙර 2018 වර්ෂය තුළදී සැලකිය යුතු ප්‍රගතියක් ලබාගැනීමට අවස්ථාවක් නොලැබිණි. කෙසේ නමුත්, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත පියවිය යුතු රු.4,948,542.72 ක මුදල හා වී මිලදී ගැනීම සඳහා ලබාදුන් රු.13,000,000.00 ක මුදලින් නොපියවන ලද රු.10,011,086.00 ක මුදල කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අතර ඉල්ලුම් කරන ලද රු.14,959,628.72 ක ප්‍රතිපාදන 2019 ජනවාරි මාසයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත. අදාල ගිණුම්ගත කිරීම විධිමත්ව සිදු කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | 2006 වර්ෂයේදී වී මිලදීගැනීමේ අත්තිකාරම් ලබාදීමට අදාලව ආරම්භ කළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ගිණුමේ, පසුගිය වර්ෂ 5 ක අයවීම් විස්තර අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු. 10,766,151 ක හිඟ ශේෂයක් පැවතුණි. 2017 නොවැම්බර් 16 දින රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන් අතර පැවති සාකච්ඡාවට අනුව හිඟ මුදල අය කර ගත හැකි බවට කරුණු ඉදිරිපත් වී තිබූ නමුත් 2018 වර්ෂය තුළදී ඊට අදාල ඉදිරි පියවරක් ගැනීමක්/ ප්‍රගතියක් විගණනයේදී නිරීක්ෂණය නොවීය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට සෘජුව මැදිහත් වීමට හැකියාවක් නොමැති අතර නිරන්තරව පසුවිපරම් සිදුකරමින් අදාල ආයතනවලට උපදෙස් හා සහාය ලබාදෙමින් අත්තිකාරම් අයකර ගැනීම සඳහා අතරමැදියෙකු වශයෙන් පමණක් ක්‍රියා කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 දෙසැම්බර් 31 දින වනවිට මාතලේ දිස්ත්‍රික් ලේකම්ගෙන් අයවිය යුතු මුදලරු. 2,243,000 ක් වූ අතර එම මුදල ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතියට අදාලමුදලක් විය. ලිපිගොනුව අනුව, එම සමිතිය විසින් මෙම මුදල රු. 5,000 ක මාසික වාරික ලෙසගෙවමින් පැවතුණු අතර එපරිදි අයවීම් සිදු වුවහොත් ඉහත කී හිඟ මුදල අය වී අවසන් වීමට ඉදිරි වර්ෂ 37 කට අධික කාලයක් ගත වන බව නිරීක්ෂණය කෙරේ. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | ලග්ගල විවිධ සේවා සමූපකාර සමිතිය මේ වන විට ආර්ථික අපහසුතාවයන් මත පවත්වාගෙන යනු ලබන බැවින් ප්‍රමාණාත්මකව අයකර ගැනීම දුෂ්කර බව දන්වනු කැමැත්තෙමි. |
| (v) | 2018 දෙසැම්බර් 31 දින වනවිට දිස්ත්‍රික් ලේකම් - අනුරාධපුර වෙතින් අයවිය යුතු මුදලරු. 36,533,853 ක් වූ අතර මෙම හිඟ මුදල් අයවීම මන්දගාමී බවක් විගණනයේදී නිරීක්ෂණය විය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | මේ අතුරින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් හා විවිධ සේවා සමූපකාර සමිති වෙතින් හිඟ මුදල් අයකර ගත හැක්කේ අදාල නඩු තීන්දු ලැබීමෙන් පසුව බව දන්වමි. |
| (vi) | මාතලේ, මහනුවර හා අනුරාධපුර යන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රු. 595,747 ක් හා 2019 මාර්තු වනවිට රු.75,000 ක මුදලක්, අත්තිකාරම් පියවීම සඳහා ලැබී තිබිම හේතුවෙන් එම ආයතනවලින් තවදුරටත් අයවිය යුතු මුදල රු.51,304,691 ක් විය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | පසුගිය වර්ෂය තුළදී මාතලේ, මහනුවර හා අනුරාධපුර යන දිස්ත්රික් ලේකම් කාර්යාල විසින් පිළිවෙලින් රු.60,000.00, රු. 330,000.00 හා රු. 198,480.00 බැගින් අත්තිකාරම් මුදලින් නිරවුල් කරන ලද අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් රු.7,266.50 ක් මුදලින් පියවීමට කටයුතු කරන ලදී.<br>2019.03.31 දිනට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිරවුල් කළ මුදල රු.15,000.00 ක් වන අතර මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නිරවුල් කළ මුදල රු.60,000.00 කි. |

| | | | |
|---|---|---|---|
| (vii) | 2019 මාර්තු වනවිට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු රු.55,927,666 ක් වූ අත්තිකාරම් ශේෂය, එදිනට අයවීමට ඇති මුළු අත්තිකාරම් ශේෂයෙන් සියයට 35 ක් වන අතර එය අයකර ගැනීම සඳහා ලබාගත් ඉදිරි ක්‍රියාමාර්ග ප්‍රමාණවත් බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තවදුරටත් පියවිය යුතු හිඟ මුදල රු.55,927,665.88 කි. |
| (viii) | 2008 වර්ෂයේදී වී මිලදී ගැනීම සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ අත්තිකාරම් වලින් අයවීමට පවතින රු. 681,800 ක වටිනාකම වී අලෙවි මණ්ඩලයෙන් අයවිය යුතු බව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2014 වර්ෂයේ සිට පෙන්වා දී තිබුණද, එම ශේෂය අයකර ගැනීම සඳහා අදාල ආයතනය හා සම්බන්ධ වූ බවක්/ කිසිදු ප්‍රගතියක් විගණනයට නිරීක්ෂණය නොවීය. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | සිදුකරන ලද නිරන්තර පසු විපරම්වල ප්‍රතිඵලයක් ලෙස 2019 මාර්තු මාසයේදී මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් රු.200,000.00 ක මුදලක් නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. |
| (ix) | කොළඹ දන්තායතනයේ සිදු වූ මුදල් මංකොල්ලයට අදාළව අධ්‍යක්ෂ මහ රෝහල - කොළඹ වෙත 2002 වර්ෂයේදී ලබාදී තිබූ රු. 2,408,460 ක අත්තිකාරම් ශේෂය, 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවාගැනීමට හෝ සුදුසු විධිමත් පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනිම විධිමත් කළ යුතු අතරම පසු විපරම් කටයුතු ද කළ යුතුය. | මාළිගාකන්ද උසාවියේ නඩු අංක බී/67/02 යටතේ නඩුවක් විභාගවන අතර අදාල නඩු කටයුතු අවසන් වීමෙන් පසු මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කෙරේ. |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 03.3.1 ඡේදය | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාල සමීක්සණ වාර්තාව 2019 මාර්තු 17 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිලිතුරු සපයා නැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කළ ප්‍රතිපාදන, වර්ෂය තුළදී පරිපූරක ඇස්තමේන්තු මඟින් වැඩිකර තිබූ අතර, එසේ පරිපූරක ඇස්තමේන්තු මඟින් වැඩි කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 08 සිට සියයට 126 දක්වා වූ පරාසයක පැවති බව නිරීක්ෂණය විය. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කළ ප්‍රතිපාදන, සැලසුම් කළ පරිදි උපයෝජනය කළ යුතුය. | 2018 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු, 2017 ජුනි මස තත්‍ය සේවක සංඛ්‍යාව (50) මත පදනම්ව සකස් කළ නමුදු 2018 වර්ෂයේදී කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම හා සැලසුම් කර තිබූ විදේශ පුහුණු හා වැඩමුළුවලට අමතරව, නිලධාරීන් සහභාගි කළ යුතු වූ වැදගත් වැඩමුළු සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කිරීම නිසා<br>අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. |
| (ආ) | වැය විෂයය අංක 2002 සහ 2003 සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද එකතුව රු. 400,000 ක මුළු ප්‍රතිපාදනයම වර්ෂය අවසානයේ ඉතිරි වී | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කළ ප්‍රතිපාදන, සැලසුම් කළ පරිදි උපයෝජනය කළ යුතුය. | මාණ්ඩලික නිලධාරීන් බොහොමයක් නිල වාහන වෙනුවට තම පෞද්ගලික වාහන භාවිතා කිරීම නිසා වැය විෂය අංක 2003ට අදාලව අපේක්ෂිත පරිදි ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියා වියදම් පැන නොනැඟිනි. |

තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 ක් යටතේ රු. 6,865,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 5,377,196 ක වියදමක් දරා තිබුණු අතර ඉතිරිය වූ රු. 1,487,804 ක අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 34 දක්වාවූ පරාසයක විය. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කළ ප්‍රතිපාදන, සැලසුම් කළ පරිදි උපයෝජනය කළ යුතුය. | දේශිය ගමන් වියදම් අවම වීම, 2018 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ මිලෝදා ආයතනය මඟින් මෙහෙයවනු ලබන DIPPC පාඨමාලාවේ විදේශ සංචාරය අවලංගු වීම, නිල වාහන සඳහා හිමිකම් ඇති ඇතැම් නිළධාරින් නිල වාහන වෙනුවට තම පෞද්ගලික වාහන භාවිතා කිරීම, මිලෝදා ආයතනය මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් නොමිලයේ පැවැත්වීම සහ වැටුප් මෘදුකාංගය සම්බන්ධ පුහුණු වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුය. | යම් බැහැරවීම් තිබුණ ද 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් අනුව සකස් කර තිබුණි. එම කරුණු පිළිබඳව සැලකිලිමත්වෙමින් 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 අනුව පිළියෙල කර ඇත |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, පොදු තැන්පත් ගිණුම් ආරම්භ කිරීම හා පොදු තැන්පත් ගිණුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර එසේ ආරම්භ කරන ලද පොදු තැන්පත් ගිණුම්වලින්, 2018 දෙසැම්බර් 31දිනට නිරවුල් නොවූ ගිණුම් ශේෂය රු. 76,867,205,607 ක් විය. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | |
| (i) | අංක 243/2015 හා 2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 6000/15 කාණ්ඩයේ තැන්පතු ගිණුම් ශේෂයන් ශුන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට 6000/15 කාණ්ඩයේ ගිණුම්හි රු. 22,339 ක හර ශේෂයක් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම හර ශේෂයන් දෙක 2018 වර්ෂයේ ඇතිවූ ශේෂයන් 2 ක් වන අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කරන මෙන් ලිඛිතව උපදෙස් ලබාදී ඇත |

| | | | |
|---|---|---|---|
| (ii) | ඉහත කී චක්‍රලේඛය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා වූ 6003 තැන්පතු ගිණුම් ද පියවීමට අපේක්ෂා කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් 04 ක එකතුව රු. 10,674,858 ක හර ශේෂ පැවතුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය මගින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හර ශේෂය එම හර ශේෂය නිරවුල් කිරීමට අදාල කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව එම හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |
| (iii) | අංක 243/2015 හා 2015 ජුනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මගින් පවත්වා ගෙන යා හැකි තැන්පතු ගිණුම් කාණ්ඩ පිළිබඳව විස්තර දක්වා තිබුණු නමුත් ඒ තුළ නොවූ 6000/3 සහ 6000/286 තැන්පතු කාණ්ඩ ගිණුම්වල ද එකතුව රු. 940,723 ක් වූ හර ශේෂ පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තැන්පතු ගිණුමක පවතින රු.929,022.93 ක හර ශේෂයක් නිරවුල් කිරීමට අදාල විෂය පථය පැවරුනු නව අමාත්‍යාංශ කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්තමානයේ අදාල විෂය පථය අදාලවන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.<br>තවත් ගිණුමක පවතින රු.11,700.00ක හර ශේෂය 2009 වර්ෂයට පෙර සිට පැවතෙන ශේෂයක් වන අතර ඒ පිළිබඳ සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කරමින් ඇත. |
| (ආ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්තිකාරම් “බී”ගිණුම් අධීක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ අතර කාර්යක්ෂම ගෙවීම් හා අයකිරීම් ක්‍රමයක් ඇති කිරීම, ඒ මගින් අපේක්ෂිත ප්‍රතිඵලය ලෙස හඳුනා ගෙන තිබුණි. එසේ වුවද, නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ පරිදි, ආයතන 62 කට අයත් වසර ගණනාවක සිට පැවත එන, අත්තිකාරම් “බී”ගිණුම්වල විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් කළ, සේවය හැර | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය මගින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් 2017.12.29 දිනැති අංක 262/2017 දරණ චක්‍රලේඛය නිකුත් කිරීමට අමතරව සියලුම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල වර්ෂ 5 ට වැඩි පැරණි ණය ශේෂ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.<br>එසේම මිය ගිය නිලධාරීන්ගේ රක්ෂණ භාර අරමුදල ඇපයට තබා ලබා ගෙන ඇති ණය ශේෂය වන රු. 532,351.29 ක මුදල සම්පූර්ණයෙන්ම අයකර ගෙන ඇත.<br>එසේම "වැඩිපුර අය කිරීම්" (ණය හිමියන්) තිබෙන ආයතන 12 ක් වූ අතර එම ණය ශේෂ නිරවුල් කිරීමටද ලිඛිත උපදෙස් ලබා දෙන ලදී.<br>මේ වන විට අයවී ඇති එහෙත් ගිණුම් |

| | | |
|---|---|---|
| ගිය හා ස්ථාන මාරුවීම්වලට අදාළ එකතුව රු.301,148,736 ක අය නොවන ශේෂ පැවතුණි.<br>එම හිඟ ශේෂ අය කර ගැනීමට ප්‍රමාණවත් උපදෙස් ලබා දී තිබූ බවක් විගණනයේදී නිරීක්ෂණය නොවීය. | | පොත් තුල තවමත් පවතින හිඟ ණය ශේෂ, මුදල් රෙගුලාසි හා අදාල චක්‍රලේඛ ප්‍රකාරව එම ගිණුම් පොත් නිවැරදි කිරීමට අදාළ ලිඛිතව උපදෙස් ලබා දෙන ලදි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනටදෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 10 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් පැවතුණි. | බාධාවක් නොවන අයුරින් දෙපාර්තමේන්තු කාර්යයන් කර ගෙන යාමට හැකි වන පරිදි පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. | 2018.12.31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 05න් තනතුරු 02ක් යටපත් කර ඇති අතර දැනට ජ්‍යෙෂ්ට මට්ටමේ පුරප්පාඩු 04ක් පවතී. තවද අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) හා ශ්‍රී.ලං.ග.සේ. තනතුරුවල පුරප්පාඩු පුරවන මෙන් දිගින් දිගටම ලිපි මඟින් ඉල්ලා ඇත.<br>තෘතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරී තනතුර මේ වන විට යටපත් කර ඇත. එමෙන්ම ද්විතියික මට්ටමේ පැවතුන පුරප්පාඩුවද මේ වන විට සම්පූර්ණ කර ඇත. 2018.12.31 දිනට ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03ක් පැවතුන අතර එයින් රියදුරු තනතුරක් මේවන විට යටපත් කර ඇති අතර අනෙකු රියදුරු තනතුර සහ කාර්යාල කාර්ය සහායක තනතුරු පුරප්පාඩුව සඳහා නිළධාරීන් ලබා දෙන මෙන් දිගින් දිගටම ඉල්ලීම් කර ඇත. |